## මැදදුම්බර ප්‍රාදේශිය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 27 දින සභාපතිවරයා වෙත යවන ලදි.

#### 1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මැදදුම්බර ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.9,717,760 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

#### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,823,186 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 26,089,505 ක් විය.

#### 2.2 ආදායම් පරිපාලනය

##### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 2,830 | 973 | 1,826 |
| (ii) බදු කුලී | 3,178 | 2,379 | 1,338 |
| (iii)බලපත්‍ර ගාස්තු | 793 | 800 | - |
| (iv)වෙනත් ආදායම් | 2,055 | 1,260 | 795 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 588,250 |
| (ii) මුද්දර ගාස්තු | 6,213,697 |

### 2.2.3 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

සම්ප්‍රේෂණ කුළුණු සඳහා වාර්ෂිකව සභා තීරණ මත වෙළඳ බලපත්‍ර ගාස්තු වශයෙන් නිශ්චිත මුදලක් සභාවට අයකර ගත හැකි වුවත් ඒ සම්බන්ධව අවධානය යොමු වී නොතිබුණ අතර , පසුගිය වර්ෂ 03 කට අදාලව දළ වශයෙන් රු.100,000 කට වැඩි මුදලක් සභාවට අහිමි වී තිබුණි.

### 2.2.4 පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් අනු ප්‍රමාණයන් මත ව්‍යාපෘති 06 ක් සඳහා අයකළ යුතු රු.46,200 ක පරිසර ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි.

2.2.5 ගව මස් ප්‍රවාහන ගාස්තු

1988 අගොස්තු 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව 520/7 දරන ප්‍රාදේශිය සභා පොදු සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 32 ව්‍යවස්ථාවේ 09 වන වගන්තිය අනුව සභාපතිවරයාගේ විශේෂ බලපත්‍ර මත සභා බල ප්‍රදේශයට ගෙන එනු ලබන මස් පශු වෛද්‍යවරයා විසින් පරික්ෂා කල යුතු අතර, එසේ පරික්ෂා කරන සෑම කිලෝවකටම රු.10 කට වැඩි නොවන ගාස්තුවක් අය කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ එසේ අයකර නොතිබිම හේතවෙන් දල වශයෙන් රු.96,000 ක පමණ ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

2.2.6 තෙල්දෙණිය සතිපොල ආදායම

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(i) 2011 ජනවාරි 01 සිට 2011 මාර්තු 30 දක්වා කාලසීමාවට අදාලව සතිපොල බදු දීම වෙනුවෙන් බදු ගාස්තු වශයෙන් රු.77,771 ක මුදලක්, සහ නිතීවිරෝධි රැඳි සිටිම වෙනුවෙන් රු.3,000 ක මුදලක් බදුකරුවකුගෙන් සභාවට 2011දෙසැම්බර් 31 උනට අයවිය යුතුව තිබුණි. එසේම එම බදුකරුගෙන් ආරක්ෂක තැන්පත් මුදලක් ලබා ගැනීමට අදාල කොන්දේසි බදු ගිවිසුමට ඇතුලත් කර නොතිබුණි.

(ii) 2011 අප්‍රේල් 15 සිට 2011 මැයි 24 දක්වා කාලසීමාව වෙනුවෙන් තවත් පුද්ගලයකු සමඟ සභාව විසින් කිසිදු ගිවිසුමකට එළඹ නොතිබියද බදු මුදල් අයකර ගැනිමට අවසර දී තිබු අතර 2011 දෙසැම්බර් 31 දින වන විට රු.85,645 මුදලක් හිඟව තිබුණි.

(iii) 2011අප්‍රේල් 01 සිට 2011 අප්‍රේල් 11 දක්වා සහ 2011මැයි 25 සිට 2011දෙසැම්බර් 31 දක්වා කාල සිමාවට අදාලව සතපොල ගාස්තු අයකිරීමට මාර්ග කම්කරුවෙකු පත් කර තිබුණ අතර 2011 අප්‍රේල් 12 සිට 2011 අප්‍රේල් 14 දක්වා දිනයන්හිදි සතිපොල ගාස්තු ලෙස කිසිදු මුදලක් අය වී නොතිබුණි.

(iv) 2005 වර්ෂයේ තෙල්දෙණිය සතිපොල ගාස්තු වශයෙන් ඩී.එම්.සෙනෙවිරත්න යන අයගෙන් රු.15,065 ක මුදලක් 2011 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි.

2.2.7 රථ වාහන නවතා තැබීමේ ගාස්තු

2007 ජුලි 12 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ පල කරන ලද අංක 1505/18 දරන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව රථ වාහන නවතා තැබිමේ ගාස්තු අය කර නොතිබුණ අතර, 2011 වර්ෂය සඳහා කිසිදු ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි.

2.3 පාඩු හා හානි

2011 වර්ෂයේ ගබඩා සමික්ෂණ වාර්තාව අනුව වටිනාකම රු.51,648 කවු 4' 1000 වර්ගයෙ ජලනල 08 ක් අස්ථාන ගතවීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගෙන අදාල පාඩු අයකර ගැනිම පිණිස ඉදිරි කටයුතු කර නොතිබුනි.

2.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) නිතුලේමඩ බහු කාර්ය මධ්‍යස්ථානය ඉදිකිරිම් කර්මාන්තයේ දෙවන අදියරේ අවසන් වර්තාවට අනුව විෂය අංක 04 යටතේ පළමු පන්තියේ දැවයෙන් දොර හා ජනෙල් රාමු සාදා සවිකිරිම සඳහා දික් අඩි 418 කට අඩියකට රු.221 බැගින් රු.92,394 ක් ගෙවා තිබුණද, 2012 අගෝස්තු 02 දින කරන ලද භෞතික පරික්ෂාවේදි ගොඩනැගිල්ලට සවිකර තිබු දොර හා ජනෙල් රාමු දික් අඩි ප්‍රමාණය 330 ක් වුයෙන්, දික් අඩි 88 ක් සඳහා රු.19,451 ක් වැඩිපුර ගෙවා තිබුණි. විෂය අංක 06 යටතේ ගෙබිම පස් පුරවා සකස් කිරිම සඳහා කියුබ් 6.65 කට රු.13,173 ක් ගෙවා තිබුණද, ගෙබිම පස් පුරවා සකස් කර නොතිබුණි.

(ආ) තෙල්දෙණිය ආර්ථික මධ්‍යස්ථාන භුමියේ කඩ කාමර ඉදිකිරිම් සඳහා කඩ හිමියන්ගෙන් ලබාගත් අත්තිකාරම් උපයෝගි කර ගෙන රු. 188,522 ක අගයකට වූ ගොඩනැගිලි ද්‍රව්‍ය කඩ හිමියන වෙත ලබා දි තිබුණද, එම ද්‍රව්‍ය කඩහිමියන් විසින් ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි. එසේම එම කොන්ත්‍රාත්තුවේ විෂය අංක 15 යටතේ කොන්ක්‍රිට් කාණු යෙදිම වෙනුවෙන් රු.342,744 ක වියදමක් දරා තිබුණද, එම වැඩ විෂය ඉටුකර නොතිබු බව 2012 අගෝස්තු 02 දින කරන ලද භෞතික පරික්ෂණයේ දී අනාවරණය විය.

2.5 පොදු පහසුකම් සඳහා වෙන්කිරිම

පහත කරුණු නිරික්ෂණය විය.

---

(i) තෙල්දෙණිය උඩවෙල පිහිටි වලව්වත්ත ඉඩම කොටස් කර විකිණිමට අදාල අනු බෙදුම් සැලැස්ම අනුව පොදු කටයුතු සඳහා පර්චස් 10 ක් වන අංක 01 දරන ඉඩම් කොටස 2007 ජනවාරි මස වෙන්කර තිබුණද, එම බිම් කොටස නිත්‍යානුකූල පවරා ගැනිමට කටයුතු නොකිරීම හේතුවෙන් 2011 අගෝස්තු 23 දින වෙනත් පුද්ගලයකුට විකුණා තිබුණි.

(ii) 2707 ඒ දරන පිඹුරුපත අනුව පුද්ගලික සමාගමකට අයත් මුළු ඉඩම් ප්‍රමාණයෙන් , පොදු කටයුතු සඳහා වෙන් කළ බිම් කොටස 2007 නොවැම්බර් 30 දින සභාවට ලබාදීමට ලිඛිතව පොරොන්දු වී තිබුන නමුත්, 2012 අගොස්තු 06 දින වන විටත් එම ඉඩම් කොටස සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල වාර්තා වී තිබූ අනවසර ඉදිකිරීම් 35 ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 49 වගන්තිය පරිදි විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.8,512,855 ක් විය.

(ඇ) 2010 දෙසැම්බර් 27 දින වර්පනම් දේපල තහනම් කිරීමේ රාජකාරි කටයුතු සඳහා ගෙවා තිබූ රු.8,000 ක අත්තිකාරම විගණන පරීක්ෂණ අවස්ථාව වන 2012 අගෝස්තු 06 දින වන විටද නිරවුල් කරගෙන නොතිබුණි.

(ඈ) සභාවේ මහජන පුස්තකාල පොත් පිළිබඳව සමාලෝචිත වර්ෂයට අදාලව සිදු කරන ලද සමීක්ෂණයෙන් අනාවරණය වු අස්ථානගත රු.93,093 ක් වටිනා පුස්තකාල පොත් 1568 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ 153 වගන්තිය ප්‍රකාරව 2010 නොවැම්බර් සිට 2011 මාර්තු 31 දින දක්වා කර්මාන්ත 44 ක ගෙවීම්වලින් අඩු කරගෙන තිබූ රඳවා ගැනිමේ බදු රු. 262,554 ක් දේශීය ආදායම් කොමසරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලැබේ.

(i) ගිණුම්කරණය.

(ii) අභ්‍යන්තර පාලනය

(iii) ආදායම් පරිපාලනය

(iv) ණය ගැති හා ණය හිමි පාලනය